# කතෝලික ධර්මය

## 1 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

පළමු වන මුද්‍රණය - 2015
දෙවන මුද්‍රණය - 2016
තුන්වන මුද්‍රණය - 2017
හතරවන මුද්‍රණය - 2018
පස්වන මුද්‍රණය - 2019
හයවන මුද්‍රණය - 2020

සියලුම හිමිකම් ඇවිරිණි.

ISBN 978-955-25-0218-7

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
පානළුව, පාදුක්ක පිහිටි රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත්කරන ලදි.

Published by: Educational Publications Department
Printed by: State Printing Corporation, Panaluwa, Padukka.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා  ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති  අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ  අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ  අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

මනුගුණදම් සුරකින්නට නිති කැපවුණු කුසලතා පිරි මනුෂ්‍ය වර්ගයාට මේ ලෝකය වඩාත් සොඳුරු බිමක් බවට පත් කළ හැකි ය. ඒ සඳහා රටක අධ්‍යාපනය නිරතුරුවම බලසම්පන්න කරගතයුතු වන්නේ අනාගත වැඩලොව පිළිබඳව ද මනා අවදියෙන් සිටිමිනි. දිනෙන් දින විශ්ව ගම්මානය වෙත එක්වන සාරවත් නව දැනුම අපේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සමඟ මුසුකර ගැනීම අනිවාර්යයෙන් සිදුවිය යුතු අතරම අපගේ යහගුණදම් ද ඒ හා ඒකාත්මික කරගන්නට අමතක නොකළ යුතු ය. මෙම සාධනීය ගුණාංග රැකගනිමින් වඩාත් යහපත් සිසු පරපුරක් නිර්මාණය කිරීමේ උත්කෘෂ්ට මෙහෙවරට අවැසි ගුණාත්මක ඉගෙනුම් ආධාරක සම්පාදනය කිරීම අප දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ පරමාර්ථය බව අවධාරණය කරමි.

නේක විසිතුරු සිත්තම් හා අකුරුවලින් සපිරි මේ පෙළපොත් අනාගත ලොවට මඟ එළි දල්වන ප්‍රදීපස්තම්භ බඳු ය. ඔබ පාසල් බිමෙන් සමුගත් දිනක වුව, තුටින් සිහි කළ හැකි මිහිරි මතක, මේ පාඩම් පොත් පිටු අතර රැඳී තිබෙනු නිසැක ය. ගුරු තරුවල නොමඳ ආලෝකය ලබා ගනිමින් ඔබ මේ දැනුම හා වින්දනය කැටිකළ අනගි ත්‍යාගයෙන් නිසි පල නෙළා ගත යුත්තේ තව තවත් දැනුම් අවකාශ වෙත යුහුසුලුව පියමනිමිනි. රජය පෙළපොත් වෙනුවෙන් වැය කළ අප්‍රමාණ වූ ධනස්කන්ධයට අමිල අගයක් ලබා දිය හැක්කේ පාසල් සිසු දරු දැරියන් වූ ඔබට පමණි. දිවිය වෙත හඹා එන අනේක බාධක දිරියෙන් ජයගෙන, හෙට ලොව සුපුෂ්පිත කරවන්නට දැයේ දරුදැරියන්ට හැකිවේවායි අප්‍රමාණ ස්නේහයෙන් ආශීර්වාද කරන්නෙමි.

පෙළපොත් සම්පාදන ක්‍රියාවලිය වෙනුවෙන් මනා කැපවීමකින් සම්පත්දායකත්වය සැපයූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික පිරිවරටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සැමටත් මාගේ හදපිරි ස්තුතිය පිරිනමමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2020.06.26

## නියාමනය හා අධීක්ෂණය

පී. එන්. අයිලප්පෙරුම - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## මෙහෙයවීම

ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## සම්බන්ධීකරණය

ආර්.ඩී. විජේවික්‍රම - නියෝජ්‍ය කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## සහාය සම්බන්ධීකරණය

එස්. ජී. ඩී. එන්. එල්. සමරකෝන් - සහකාර කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## අනුශාසකත්වය

අතිඋතුම් දේව ධර්මාචාර්ය ඔස්වල්ඩ් ගෝමිස් අගරදගුරු හිමිපාණෝ (විශ්‍රාමික)
අතිඋතුම් දේව ධර්මාචාර්ය මැක්ස්වල් සිල්වා රදගුරු හිමිපාණෝ

## සංස්කාරක මණ්ඩලය

අතිගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා - ජාතික අධ්‍යක්ෂ, කතෝලික ධර්මෝපදේශ මධ්‍යස්ථානය, කොළඹ 08

ගරු චමින්ද වනිගසේන පියතුමා - විදුහල්පති (පාලන)
ශාන්ත ජෝශප් විදුහල, කොළඹ 10.

## ලේඛක මණ්ඩලය

නිර්මලා රත්නායක - ගුරු වෘත්තිය, ශාන්ත පීතර විදුහල, කොළඹ 4.

සී. අයිරාංගනි රුද්‍රිගු - ගුරු වෘත්තිය, ශාන්ත ලුසියා ම.වි, කොටහේන, කොළඹ 13.

ගරු. ඒ. ආර්. ලුෂියා නි.ම.නි. පියතුමා - ශාන්ත අන්තෝනි දෙව්මැදුර, දෙමටගොඩ

## චිත්‍ර සහ පිටකවරය

ඩී. ප්‍රසාද් නිශාන්ත පීරිස් - ගුරු වෘත්තිය, ශාන්ත පිතර විදුහල, කොළඹ 04.

## පරිගණක අක්ෂර සංයෝජනය හා පිටු සැලසුම්කරණය

එල්. ඒ. සඳුනි නිලංකා පත්මසිරි - පරිගණක අංශය,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# පටුන

පිටු අංකය

| | | |
|---|---|---|
| 1. | ලෝකය හරි ලස්සනයි | 1 |
| 2. | මගේ සිරුර | 2 |
| 3. | අපේ පවුල | 3 |
| 4. | දේව ආදරය තුළින් අපට ලැබුණු තවත් අය | 5 |
| 5. | දෙවිඳුන් මැවූ ලස්සන ලෝකය රැක ගනිමු | 6 |
| 6. | කිතුනු දරුවා හොඳ ළමයෙකි | 7 |
| 7. | මහෝත්තම දෙවි පියාණන් වහන්සේට කතා කරමු | 8 |
| 8. | සාන්ත කුරුසිය | 9 |
| 9. | මම දේව දරුවකු වෙමි | 10 |
| 10. | සාන්ත මරියනි දේව මෑණියනි | 11 |
| 11. | සුරැකි පියා වන ශුද්ධ වූ ජුසේ තුමා | 12 |
| 12. | ජේසුස් වහන්සේගේ උපත | 13 |
| 13. | ජේසුස් වහන්සේගේ පුදුම ක්‍රියා | 14 |
| 14. | කුරුසිය ජයගත් ජේසුස් වහන්සේ | 15 |
| 15. | ශුද්ධ බයිබලය | 16 |
| 16. | ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා | 17 |
| 17. | සාන්ත ආනාතුමිය | 18 |
| 18. | සාන්ත අන්තෝනි මුනිතුමා | 19 |
| 19. | සාන්ත සෙබස්තියන් මුනිතුමා | 20 |
| 20. | අතිඋතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා | 21 |

**ක්‍රියාකාරකම්**

ඇමුණුම් 1 සිට 13 දක්වා 23 - 35

## 1

# ලෝකය හරි ලස්සනයි



මහෝත්තම දෙවි පියාණන් වහන්සේ
හරි හොඳයි.
අපට ලස්සන ලෝකයක් මවා දුන්නා.
හරිම ලස්සනයි.

# 2

# මගේ සිරුර

මගේ ශරීරය බොහොම වටිනවා.
මා එය පිරිසිදුව තබා ගන්නවා.



මට සිරුර ලබා දුන් මහෝත්තම දෙවි පියාණන් වහන්සේට මම ආදරෙයි.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 1හි ඇත. (පිටු අංක 23)

3

# අපේ පවුල


අම්මා තාත්තා හරි හොඳයි - අපට ආදරෙයි
අක්කා අයියා නංගී මල්ලී - හරිම එකමුතුයි



මට අම්මා, තාත්තා
සහෝදර සහෝදරියන්
ලබා දුන් මහෝත්තම
දෙවි පියාණන්
වහන්සේට ස්තුතියි.

## අපේ නෑදෑයෝ

ආච්චි සීයා එක්වෙලා - කියති නිතර රස කතා
නැන්ද මාමා සමඟිනා - සිටිමු තුටින් අපි සැමා



අප නෑදෑයින්ට ආදරය කරන විට මහෝත්තම දෙවි පියාණන් වහන්සේ අපටත් ආදරය කරන සේක.

# 4

# දේව ආදරය තුළින් අපට ලැබුණු තවත් අය

අපේ ගුරුවරුන් තුළින් මහෝත්තම දෙවි පියාණන් වහන්සේ අපට ආදරය කරන සේක.



ජේසුස් වහන්සේ වගේ අපිත් අසල්වැසියන්ට සහ යහළුවන්ට උදවු වෙමු.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 2හි ඇත. (පිටු අංක 24)

5

# දෙවිඳුන් මැවූ ලස්සන ලෝකය

# රැක ගනිමු

මල් නෙළන්න නම්
ගෙඩි කඩන්න නම්
සුරකිමු ගස් වැල්




කීචි බීචි හඬ අසන්න නම්
සතුන්ගේ සුරතල් බලන්න නම්
ඔවුන් රකිමු එක් වී සතුටින්

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 3හි ඇත. (පිටු අංක 25)

6

# කිතුනු දරුවා හොඳ ළමයෙකි




ජේසු කුමරු මෙන් අපිත්
දෙවි පියාණන් වහන්සේට යදිමු.
දෙමවුපියන්ට කීකරු වෙමු.
වැඩිහිටියන්ට ගරු කරමු.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 4හි ඇත. (පිටු අංක 26)

7

# මහෝත්තම දෙවි පියාණන් වහන්සේට කතා කරමු




හිස නමා - දණ ගසා
වඳිමු අපේ දෙවි පියා
මහෝත්තම දෙවි පියාණෙනි, අපට දුන්
හැමදේටම ස්තුතියි.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 5හි ඇත. (පිටු අංක 27)

## 8

# සාන්ත කුරුසිය

උදේ සවස අපි - අඳිමු කුරුසේ නළලේ
තොල් දෙක මතටත් - පපුවේ මැදටත්
අඳිමු අඳිමු කුරුසේ.



උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 6හි ඇත. (පිටු අංක 28)

9

# මම දේව දරුවකු වෙමි

මා ප්‍රසාද ස්නාපනය ලැබුවා.

එදා සිට මා දේව දරුවෙක් වුණා.

එලෙස ම මා කිතුනු පවුලට පිළිගනු ලැබුවා.



උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 7හි ඇත. (පිටු අංක 29)

# 10

# සාන්ත මරියනි දේව මෑණියනි



දේව අම්මේ,

ඔබතුමිය බැහැපත් ය, යහපත් ය.

ජේසු සමිඳුන්ගේ

අම්මා වීමට වාසනාව ලැබුවේ

ඔබතුමිය පමණක් ය.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 8හි ඇත. (පිටු අංක 30)

# 11

# සුරැකි පියා වන ශුද්ධ වූ ජුසේ තුමා



මෙලොවෙ දී කුඩා ජේසුස් වහන්සේ රැක බලාගත්තේ ශුද්ධ වූ ජුසේ තුමා යි.

ශුද්ධ වූ ජුසේ තුමා වඩු වැඩ කළා.

කුඩා ජේසුස් වහන්සේ සුරැකි පියාට නිතර ම උදවු කළා.

ඒ වාගේ අපිත් අපේ දෙමව්පියන්ට උදවු කරමු.

උපදෙස් ඃ- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 9හි ඇත. (පිටු අංක 31)

## 12

# ජේසුස් වහන්සේගේ උපත



ජේසු කුමරුගේ උපතයි - ගවලෙනයි

සමගිය සාමය සපිරුණු - නත්තලයි

බෙදා හදා ගැන්මයි - සැම සිත් සතුටුයි

ගැලැවුම්කරුවාණෙනි


මේ තුති ඔබ වහන්සේට යි.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 10හි ඇත. (පිටු අංක 32)

13

# ජේසුස් වහන්සේගේ පුදුම ක්‍රියා

කානාවේ මඟුල් ගෙදර - මිදි යුස මදි වූවා
ජේසු සමිඳු ආවා - ජලය රැස් කෙරෙව්වා
ආසිරි ගැන්වූවා - දිය මිදි යුස වූවා
සැවොම පුදුම වූවා - සතුටින් තුති පිදුවා




උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 11හි ඇත. (පිටු අංක 33)

# 14

# කුරුසිය ජයගත් ජේසුස් වහන්සේ

ජේසුස් වහන්සේ
දුක් වින්දේ මා නිසයි.




මරණයට පත් වුණේ
මගේ වැරදි නිසයි.
උත්ථාන වුණේ මට
ආදරේ නිසයි.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 12හි ඇත. (පිටු අංක 34)

## 15

# ශුද්ධ බයිබලය



මහෝත්තම දෙවි පියාණන් වහන්සේගේ ආදර වචන අඩංගු වී තිබෙන්නේ ශුද්ධ බයිබලයේ ය. කිතුනු අපේ උතුම් ම පොත ශුද්ධ බයිබලය යි.

දේව වචනයට සවන්දෙමු; කියවමු; පිළිපදිමු.

උපදෙස් :- පාඩමට අදාළ ක්‍රියාකාරකම ඇමුණුම් අංක 13හි ඇත. (පිටු අංක 35)

16

# ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා



ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා අපේ රටේ අපෝස්තුලුවරයා ය.

ශ්‍රී ලංකාවට බිහිවුණු වීරෝදාර සාන්තුවරයාණෝ එතුමාණෝ ය.

17

# සාන්ත ආනාතුමිය

ආනා මෑණී - ජුවකීම් පියෙණී
මරි මව ඔබේ දෝණී
ආදරයෙන් හොඳ නරක කියා දී
හැදූ සුදුවර දෝණී



දෙවි සමිඳුට ආදරේ කළා
දෙව් මව් ලැබුණා තෑගි ලෙසා
ජේසු සමිඳු මුණුබුරු වූවා
දෙවි සමිඳුන් හට තුති පිදුවා

18

# සාන්ත අන්තෝනි මුනිතුමා



ශුද්ධ වූ අන්තෝනි මුනිතුමා
ප්‍රාතිහාර්යයේ සාන්තුවරයාණෝ ය.
නැති වූ දේවල් සොයා ගැනීමට
පිහිට වන්නේ මෙතුමාණෝ ය.

19

# සාන්ත සෙබස්තියන් මුනිතුමා



බෝවන රෝග සුව කිරීමට අප වෙනුවෙන් මැදිහත් වන්නේ සාන්ත සෙබස්තියන් මුනිතුමා ය.

# 20

# අතිඋතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා



ශුද්ධ වූ සභාවේ වර්තමාන නායකයාණෝ
අතිඋතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම
පියතුමාණෝ ය.
ආර්ජන්ටිනාව එතුමාගේ උපන් රටයි.
එතුමාණන් වාසය කරන්නේ රෝම නගරයේ ය.
ශුද්ධෝත්තම පියතුමා වෙනුවෙන්
අපි සැමදා යාච්ඤා කරමු.

ශ්‍රී

යා

කා

ර

ක

ම

ඔබේ රූපය අඳින්න. පාට කරන්න.

දෙවිඳුනි,

මා මැව්වාට ඔබ වහන්සේට


ස්තුතියි.

ආමෙන්.

පාට කොළවලින් මලක් කපා අලවා සැමදෙනාටම සුබ පතමු.

දෙවිඳුන්ගේ ආදරයයි - ලැබුණු අය ගොඩයි.

කැමති සුරතලා ව තෝරන්න.
බලා අඳින්න. පාට කරන්න.



මහෝත්තම දෙවි පියාණන් වහන්සේ අපට දුන් ලෝකය තවත් ලස්සන කරමු.

මෙහි හොඳ වැඩ දක්වෙන පින්තූරවලට අදාළ අංක වටා රවුමක් අඳින්න.

1



2



3



4



5




6



7




8



පුංචි ඔබ දේව තාත්තාට යාච්ඤා කරන ආකාරය අඳින්න.

ඇමුණුම් අංක 6

පාට කඩදාසි තීරු දෙකක් කපා කුරුසිය මත අලවන්න.



ඇමුණුම් අංක 7

ඔබ කැමති පාට පැන්සලකින් තිත් ඉරි උඩ අඳින්න.

මම

ප්‍රසාද්

ස්නාපනය

ගැඹුමවමි.

ඇමුණුම් අංක 8

පාට කොළ ඉරා අලවා මල ලස්සන කරන්න.



කුඩා ජේසු සමිඳුන් දේව මෑණියන්ට ආදරය කළාක් මෙන් ඔබත් ඔබේ අම්මාට ආදරය කරන බවට දේව මෑණියන්ට පොරොන්දු වෙන්න.


ඇමුණුම් අංක 9

වඩු වැඩ සඳහා භාවිත කළ උපකරණ සොයා, පුටුවේ රූපයට යා කරන්න.



ඇමුණුම් අංක 10


මෙම නත්තල් ගස සරසන්න.



ජේසු කුමරු මෙන් අපිත් බැහැපත් වෙමු.

කොඩි ගසේ ඇති වචනවල අඩු අකුරු පුරවන්න.

| |
|---|
| නා |
| හා |
| මි |
| පු |
| ගෙ |



| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රා | ති | | ර් | ය | ය |

| | | | |
|---|---|---|---|
| | දි | යු | ෂ |

| | | | | |
|---|---|---|---|---|
| ජේ | | ස | මි | ඳු |

| | | | | |
|---|---|---|---|---|
| කා | | නු | ව | ර |

| | | | | | |
|---|---|---|---|---|---|
| ම | ඟු | ල් | | ද | ර |


ඇමුණුම් අංක 12

හොඳ වැඩ කරන්න. ඔබ කරන හැම හොඳ වැඩක් වෙනුවෙන් ම මෙහි මලක් අලවන්න. කටු ඔටුන්න වෙනුවට මල් ඔටුන්නක් සාදන්න.



★ චතාරික කාලය පුරාවටම මෙය ක්‍රියාත්මක කරන්න.

කඩ ඉරි යා කරන්න. පහන පාට කරන්න.



ශුද්ධ බයිබලයට ගරු බුහුමන් දක්වන්න.

පිටු අංක 11, 12, 17, 18, 19, 20, 21, යන පිටුවල අඩංගු චිත්‍ර අන්තර්ජාලය ඇසුරින් ලබා ගන්නා ලදී.